# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 1984/10 - 2016 සැප්තැම්බර් මස 13 වැනි අඟහරුවාදා - 2016.09.13**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංක : IR/22/54/2011

**කාර්මික ආරාවුල් පනත 131 වැනි අධිකාරය**

131 වැනි අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2013.11.27 දිනැති හා අංක 1838/27 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2013.11.19 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් නෑගම්පහ, වලස්වැව හි පදිංචි එස්. ආර්. එස්. කේ. රත්නසිරි මයා හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 05, කිරුළ පාර, අංක 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2016.04.27 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එම්. ඩී. සී. අමරතුංග,
කම්කරු කොමසාරිස්.

2016 සැප්තැම්බර් මස 03 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

කාර්මික අධිකරණයේ දී ය.

ගොනු අංකය : IR/22/54/2011

එස්. ආර්. එස්. කේ. රත්නසිරි මයා,
වලස්වැව, නෑගම්පහ.

නඩු අංකය : ඒ - 3527 (පළමු පාර්ශ්වය)

එරෙහිව,

ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය,
නො : 200,
කිරුළ පාර,
කොළඹ 05.

(දෙවන පාර්ශ්වය)

ප්‍රදානය

ගරු කම්කරු හා කම්කරු සබඳතා ඇමති වන ගාමිණි ලොකුගේ මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශෙෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අනපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ගරු ඇමතිතුමා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා 2013.11.19 වන දින බේරුම්කරු ලෙස පත් කොට මා වෙත යොමු කරනු ලැබීය.

ඉහත පාර්ශ්වයන් දෙක අතර ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ :

''ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ vii ශ්‍රේණියේ සේවයේ නියුතු එස්. ආර්. එස්. කේ. රත්නසිරි මහතාට 1996.10.01 දින සිට මේ දක්වා වසර 16 කට අධික කාලයක් උසස්වීම් ලබා නොදීමෙන් යම් අසාධාරණයක් සිදුවූයේ ද යන්න සහ එසේ අසාධාරණයක් සිදුවූයේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේද යන්න පිළිබඳව වේ.''

දෙපාර්ශ්වයේ ප්‍රකාශ බේරුම්කරණය සඳහා ඉදිරිපත් කිරීමෙන් පසු එකිනෙකා ප්‍රකාශ හුවමාරු කිරීමෙන් පසු 2014.06.16 වන දින විභාගයට ගන්නා ලද අවස්ථාවේදී දෙපාර්ශ්වය අතර සමථයක් ඇති බව දන්වන ලදී. ඒ අනුව 2014.07.07 දින විභාගයට කැඳවූ අවස්ථාවේදී ඉල්ලුම්කරුට 4 වන ශ්‍රේණියේ උසස්වීමක් ලබා දී ඇති බවත් ඒ සඳහා වූ පත්වීම් ලිපියද ඉදිරිපත් කරන ලදී. 2014.07.23 වන දින නැවත පරීක්ෂණයට කැඳවූ අවස්ථාවේදී ඉල්ලුම්කරු කියා සිටියේ වාර්ෂික වැටුප් වැඩිවීම සහ වැටුප් සංශෝධන අතර නොගැලපීමක් සිදුවන බැවින් ආර්ථිකමය පාඩු සිදුවන බැවින් නැවත



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ගමනා ගමන මණ්ඩලය සමග සාකච්ඡා කිරීම සඳහා අවස්ථා කිහිපයක් ලබා දෙන ලදී. 2015.07.13 දිනැති ඉල්ලුම්කරුගේ ලිපියත් බේරුම්කරු සඳහා ලිපිගොනුවට ඉදිරිපත් කරන ලද්දේ 2015.07.14 දිනය. ඒ පිළිබඳව දෙපාර්ශ්වයටම විරෝධතා තිබේ නම් ඉදිරිපත් කිරීමට දින ලබා දෙන ලදී. ඉල්ලුම්කරු දින කීපයක් ඉදිරිපත් වීමෙන් 2015.07.13 ලිපියෙන් සහ 2015.07.14 දින ඉල්ලුම්කරු තමන්ට උසස්වීම ලැබී ඇති බවත් එයින් සෑහීමකට පත්වන බවත් වැටුප් වැඩිවීමේ ගැටලුව ආයතන චක්‍ර ලේඛන අනුව විසඳිය නොහැකි බැවින් මෙම නඩුව තවදුරටත් පවත්වාගෙන නොයන බවත් දන්වා සිටීම මත වගඋත්තරකරු වන ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය එයට විරෝධතාවයක් හෝ අතුරු කොන්දේසියක් ඉදිරිපත් නොකරයි. ඒ අනුව මෙම නඩුවේ කටයුතු මෙයින් අවසන් කරමි.

මෙම ප්‍රදානය සාධාරණ හා යුක්ති සහගත බව සහතික කරමි.

ආර්. එස්. ආරියප්පෙරුම,
කාර්මික අධිකරණය.

2016 අප්‍රේල් මස 27 දින දී ය.

09 - 996